# නගරය පිළිබඳ ඉදිරිපත් වී ඇති විවිධ න්‍යායන් විවේචනාත්මකව සාකච්ඡා කිරීම

**එම්.ජී.එල්.එම්. ප්‍රේමරත්න**

## හැඳින්වීම

මානව සමාජය පිළිබඳ සමාජ විද්‍යාත්මකව අවබෝධ කරගැනීමේදී මිනිසා ජීවත්වන සමාජ අවකාශය පිළිබඳව අවබෝධ කරගැනීම වැදගත් වේ. එවැනි ආකාරයට මිනිසා ජීවත් වන ප්‍රධාන සමාජ අවකාශයක් ලෙස "නගරය" දැක්විය හැකිය. නගරය යන සංකල්පය නිර්වචනය කිරීමේදී ලෝකයේ විවිධ රටවල් විවිධ සාධක කෙරෙහි අවධානය යොමු කරන බව දැකිය හැකිය. එහිදී නාගරික ප්‍රදේශයක සිටින ජන සංඛ්‍යාවත්, පරිපාලන කටයුතු ඒකරාශීවීමත්, නිවාස සංඛ්‍යාවත්, කෘෂි කාර්මික නොවන රැකියාවල නිරතව සිටින පිරිමින් ප්‍රමාණය හෝ ආර්ථික කටයුතු යනාදීය ඇතුළත්ව තවත් විවිධ කරුණු මත නාගරික ප්‍රදේශයන් පිළිබඳව නිර්වචනය කිරීම සිදු කරනු ලැබේ (මානවඩු හා ලියනගේ 2008: 16 - 18). බූෂානා (1994) දක්වන්නේ නගරයක් යනු "කෘෂි කාර්මික නොවන රැකියාවල යෙදී සිටින, කුඩා භූගෝලීය ප්‍රදේශයකට මිනිසුන් කේන්ද්‍රගත වී පදිංචිව සිටින ප්‍රදේශයක්" බවයි (බූෂානා 1994). ඉහත නිර්වචනයන් දෙස බලනවිට දැකිය හැක්කේ නගරයක් යන්න විවිධ වූ සාධක පදනම් කරගෙන නිර්වචනය කර ඇති අතර, නගරය විවිධ සමාජ අන්තර් ක්‍රියාවන් සිදුවන සංකීර්ණ සමාජ අවකාශයක් බවයි.

ඉහත ආකාරයට නිර්වචනය කරන ලද නාගරික සමාජ අවකාශය වෙත ජනගහනය සැලකිය යුතු ප්‍රමාණයකින් ඒකරාශීවීම සිදුවන බව දැකිය හැකිය. එක්සත් ජාතීන්ගේ සංගමය (2002) දක්වා ඇත්තේ දැනට ලෝකයේ ජීවත්වන මුළු ජනගහනයෙන් 48% ක් නාගරිය යැයි සම්මත ප්‍රදේශවල ජීවත්වන බවයි (උපුටා ගත්තේ ද සිල්වාගෙනි 2004: 190). ලෝකයේ නාගරික ජනගහනයේ ප්‍රතිශතය 1950 වන විට 30% ක් වූ අතර, එය 2000 වන විට 47% ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, අනාගත ප්‍රක්ෂේපණ වලට අනුව ලෝකයේ නාගරික ජනගහනයේ ප්‍රතිශතය 2030 වනවිට 60% ඉක්මවන තත්ත්වයක් පෙන්නුම් කෙරේ (ද සිල්වා 2004: 195). මෙම දත්ත අනුව බලනවිට පෙනීයන්නේ අනාගතයේදී සමස්ත ලෝක ජනගහනයෙන් භාගයකට අධික ජනසංඛ්‍යාවක් නාගරික ප්‍රදේශවල ජීවත්වීම සිදුවිය හැකි බවයි. එසේම වර්තමානයේදීද ජනගහනයෙන් භාගයකට ආසන්න ප්‍රතිශතයක් නාගරික සමාජ අවකාශය තුළ ජීවත්වන බව දැකිය හැකිය. නාගරික ජනගහනය පිළිබඳව ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වය විමසා බලනවිට දැකිය හැක්කේ ද ශ්‍රී ලංකාවේ ද නාගරික ජනගහනයේ වර්ධනයක් දැකිය හැකි බවයි. එක්සත් ජාතීන්ගේ සංගමය (2002) දක්වා ඇති ආකාරයට අනුව වසර 2000 දී ශ්‍රී

ලංකාවේ නාගරික ජන ප්‍රතිශතය 22.8% ක් වන අතර, 2010 වර්ෂයේදී 26.4% දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ (උපුටා ගත්තේ ද සිල්වාගෙනි 2004: 190). මේ අනුව දැකිය හැක්කේ සමස්ත ලෝකයේම නාගරික ජනසංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් සිදු වී ඇති බවයි. එසේම ශ්‍රී ලංකාවේ ද එවැනිම ආකාරයට වර්ධනීය තත්ත්වයක් දැකිය හැකිය.

ඉහත දක්වා ඇති ආකාරයට නාගරික සමාජ අවකාශයක විශාල ජනසංඛ්‍යාවක් මෙන්ම විවිධ සමාජ අන්තර් ක්‍රියාවන්ගෙන් සමන්විත වූ සමාජ අවකාශයක් ගොඩනැගී ඇති බව දැකිය හැකිය. මෙවැනි සංකීර්ණතාවයක් ඇති නාගරික සමාජ අවකාශය පිළිබඳව විවිධ සමාජ විද්‍යාඥයින් හා නාගරික සමාජ විද්‍යාඥයින් විසින් විවිධ වූ න්‍යාත්මක කරුණු හරහා විග්‍රහ කර ඇත. මෙම ලිපිය මගින් මූලික වශයෙන් සිදුකරනු ලබන්නේ එවැනි ආකාරයට නාගරික සමාජ අවකාශය පිළිබඳව ඉදිරිපත් වී ඇති විවිධ න්‍යායන් විවේචනාත්මකව සාකච්ඡා කිරීමයි. එහිදී මෙම ලිපියේ ඉදිරි කොටස්වලින් නගරය පිළිබඳව ඉදිරිපත් වී ඇති සම්භාව්‍ය න්‍යායාත්මක පර්යාවලෝකය පිළිබඳව විවේචනාත්මකව සාකච්ඡා කිරීමත්, නගරය පිළිබඳව ඉදිරිපත් වී ඇති චිකාගෝ ගුරුකුලයේ න්‍යායාත්මක අදහස් පිළිබඳව විවේචනාත්මක විග්‍රහයක් හා නගරය පිළිබඳව ඉදිරිපත් වී ඇති නව වෙබර්වාදී හා නව මාක්ස්වාදී න්‍යායාත්මක පර්යාලෝකයන් පිළිබඳව විවේචනාත්මක ඉදිරිපත් කරනු ලැබේ. මෙම ලිපියේ අවසාන කොටසින් සමස්ත ලිපිය පිළිබඳව සමාලෝචනය ඉදිරිපත් කරනු ලැබේ.

**නගරය තේරුම් ගැනීම සඳහා වැදගත් වන සම්භාව්‍ය න්‍යායාත්මක පර්යාවලෝකයන්**

නගරය පිළිබඳ ගොඩනැගී ඇති න්‍යායන් අතර නගරය පිළිබඳව අදහස් ඉදිරිපත් කළ සම්භාව්‍ය සමාජ විද්‍යා න්‍යායධරයන් ලෙස ෆර්ඩිනන් ටෝනිස්, එමිල් ඩර්කයිම්, මැක්ස් වේබර්, හා කාල් මාක්ස් වැදගත් වේ. මෙම න්‍යායධාරා විමසීමේදී ඒවා හරහා නගරයේ ව්‍යුහාත්මක පැතිකඩ, කෘත්‍යාත්මක පැතිකඩ මෙන්ම පුද්ගල ක්‍රියාකාරීත්වය පිළිබඳව අවධානය යොමුකර ඇති බව දැකිය හැකිය (ලේකම්ආරච්චි 2009: 89-90). මෙම කොටසේදී කාල් මාක්ස, මැක්ස් වේබර් හා ජෝජ් සිමෙල්ගේ න්‍යායාත්මක අදහස් ඉදිරිපත් කරනු ලැබේ.

**කාල් මාක්ස්**

මාක්ස් විසින් දක්වන්නේ වැඩවසම් යුගයේ සිට ධනවාදයට මාරුවීම නගර බිහිවීමේ අවධිය ලෙසය. එසේම ධනාවාදී සමාජයේ පූර්ණ නගරයක් දැකිය හැකි බව මොහු දක්වයි. මාක්ස්ට අනුව ම්ලේච්ඡත්වයේ සිට ශිෂ්ටාචාරගත වූ තලයකට නගරය පරිණාමනය වී තිබේ. තව ද මොහු පෙන්වා දෙන්නේ වඩා නොදියුණු සමාජයක සිට තාක්ෂණික මෙවලම් භාවිත කරන සමාජයක් දක්වා කාර්මිකරණය මානව සමාජයට ශිෂ්ටත්වය උදකර දුන් බවයි (මාක්ස්, උපුටා

ගත්තේ ලේකම්ආරච්චිගෙනි 2009: 90-91). එසේම මාක්ස් දක්වන්නේ නාගරික සමාජයක ධනේෂ්වර පන්තිය හා කම්කරු පන්තිය සිටින බව දක්වයි (මාක්ස්, උපුටා ගත්තේ ස්ලැට්ටෙරිගෙනි 1985: 20). මාක්ස්ගෙ න්‍යාය මගින් නගරයක ක්‍රියාත්මක වන ආර්ථික සාධකයේ බලපෑම පිළිබඳව යම් අවබෝධයක් ලබාගැනීමට උපකාරි වේ. නමුත් මොහුගේ න්‍යායට එල්ලවන විවේචන වන්නේ ආර්ථික සාධකය මත පමණක් කේන්ද්‍රගත වී ඇති අතර, සෙසු සාධක නොසලකා හැර ඇති බවයි (ගිඩින්ස් 2001). එසේම නගරයක ධනපති පන්තිය හා කම්කරු පන්තිය පමණක් සිටින බව දැක්වුවද වෙබර් දක්වන්නේ මධ්‍යම පන්තිතයක් සිටින බවයි.

**මැක්ස් වේබර්**

මොහු විසින් 'The city' නම් කෘතිය මගින් ඔහුගේ නගරය පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇත. මොහුට අනුව නගරය යනු වෙළඳ පලකි. නගරය තිබෙන බලපවත්ම දේ වෙළඳපළ බව මොහු දක්වයි. නගරයක ඇති සබඳතා වඩා තාර්කික වන අතර, එම සබඳතා තීරණය වන්නේ වෙළඳපළ මත බව මොහු දක්වයි. මොහු විශේෂයෙන් මධ්‍යකාලීන යුගයේ නගර ගැන කතා කර ඇති නමුත්, එමගින් නූතන සමාජයේ දැකීමට ලැබෙන ලක්ෂණ ඉදිරිපත් කර ඇත. එනම් නිලබලවාදයේ මතුවීම, නූතන පාලන ත්‍රන්ත හා ප්‍රජාතනත්‍රවාදය, නව ව්‍යාපාරික පන්තිය හා මූල් කාලීන ධනවාදි ව්‍යවසායන් වන අතර, මේවා මගින් වැඩවසම් සමාජයේ සිට ධනවාදි සමාජයට වෙනස්වීම සඳහා උපකාරිවීම සිදුවනවා මෙන්ම සම්ප්‍රදායික සමාජයේ සිට තාර්කික සමාජයට වෙනස්වීමට උපකාරි වේ (ස්ලැට්ටෙරි 1985: 20). එසේම නගරය විශාල ක්‍රියාවලියක් හා සම්බන්ධ අතුරු ක්‍රියාවලියක් ලෙසට දකින වේබර් ප්‍රධාන ප්‍රවේශ කිහිපයක් නගරයක අත්‍යවශ්‍ය අංග ලෙසට දකී. ඒවානම්; 01. වෙළඳ හා වාණිජ සබඳතා 02. උසාවි සහ නීතිය 03. දේශපාලනික ස්වාධිකාරය 04. ස්ව ආරක්ෂාව පිළිබඳ රණකාමීත්වය 05. සමාජ සබඳතා සහ සංවිධාන හා බැඳුණු සහභාගීත්වය (වේබර්, උපුට ගත්තේ ලේකම්ආරච්චිගෙනි 2009: 90). ලේකම්ආරච්චි දක්වන්නේ වේබර්ගේ නගරය පිළිබඳ දැක්ම ආර්ථිකමය හා දේශපාලනමය ප්‍රවේශයක් ගනු ලබන බවයි (2009: 90).

**ජෝර්ජ් සිමෙල්**

මොහු විසින් 'නාගරිකරණයට' වඩා 'නාගරිකත්වය' පිළිබඳ කේන්ද්‍රීය අවධානයක් සිය අධ්‍යයන මගින් ඉදිරිපත් කර ඇති අතර, මොහු විසින් නගර දෙස මනෝවිද්‍යාත්මක ප්‍රවේශයකින් බලා ඇත (ලෙකම්ආරච්චි 2009: 92). මොහු විසින් 1903 දී 'The Metropolis and Mental Life'ෙ යන මොහුගේ ප්‍රසිද්ධ රචනයට අනුව නගරය මගින් අද්විතීය ආකාරයේ

පෞරුෂයක්, සහ නාගරික ජීවිතය පිළිබඳ ගණනය කරන ලද, සංකීර්ණ මානසික තත්ත්වයක් ඇති කරනු ලබයි. එසේම වෙළඳපළ ආර්ථිකය නිසා මුදල්මත පදනම් වූ, පුද්ගල ලැදිකම් හා තාර්කික ගණනය කිරීම් ඇති සම්බන්ධතා ඇති කරයි. එසේම මොහු දක්වන්නේ නගරයකදී මිනිසා විසින් අනෙක් මිනිසුන්ව පුද්ගලයන් ලෙසට වඩා ද්‍රව්‍ය ලෙස දකින බවයි. උදාසීන ආකල්ප, පුද්ගලයා හුදකලාවීම හා පෞරුෂ ගැටලු ද ඇති විය හැකි තැනක් ලෙස නගරය දකින ලදී. එසේම මෙවැනි තත්ත්වයන් නිසා සමහරු මෙම අවකාශයෙන් පිටවී යන අතර, සමහරු තම ජීවිතය හෝ නිවාස අතහැර යයි (සිමෙල්, උපුටා ගත්තේ ස්ලැට්ටෙරිගෙනි 1985: 21). නමුත් මොහු නරගයක් දෙස සෘණාත්මකවම සංජානයය කර නොමැති අතර, නගරයේ ධනාත්මක පැති කඩයන් ද පවතින බව දක්වයි. එනම් නාගරික අවකාශය තුළ දී පුද්ගලයාට සාම්ප්‍රදයික පාලනයන්ගෙන් නිදහස්වීමට, තමන්ගේ නිර්මාණශීලීත්වය වර්ධනයට හා පුද්ගල වර්ධනයට ඉඩ ප්‍රස්ථාව පවතින බව සිමෙල් දක්වයි (සිමෙල්, උපුටා ගත්තේ ස්ලැට්ටෙරිගෙනි 1985: 21).

**නගරය තේරුම් ගැනීම සඳහා වැදගත් වන චිකාගෝ ගුරුකුලයේ න්‍යායාත්මක පර්යාවලෝක**

නගරය පිළිබඳව තෝරුම් ගැනීමේදී ඉහත දක්වූ සම්භාවය චින්තකයන්ගේ අදහස් ද වැදගත් වූ අතර, නාගරික සමාජ විද්‍යාවක් ආරම්භවීම සඳහා දයකත්වයක් සැපයීමේදී චිකාගෝ ගුරුකුලය වැදගත් වේ. මෙම ගුරුකුලය පරිසර විද්‍යාත්මක ගුරුකුලය ලෙස ද හඳුන්වයි. මෙම ගුරුකුලයේ පර්යේෂණ බොහෝවිට චිකාගේ නගරය ආශ්‍රය කොටගෙන සිදු වූ අතර, මේ යටතේ රොබට් කේ පාර්ක්, අනර්ස්ට් බර්ජ් හා ලුවිස් වර්ත් වැනි න්‍යායවේදීන්ගේ දයත්වය වැදගත්ය (ස්ලැට්ටෙරි 1985: 22). එම න්‍යායවේදීන්ගේ අදහස් පහත තවදුරටත් විග්‍රහ කරනු ලැබේ.

**රොබට් කේ පාර්ක්**

මොහු විසින් 1915 දී නාගරික අවකාශය බාහාලුමක් ලෙසත්, නගරය ගොඩනඟන ලද පරිසරයක් ලෙසත් පෙන්වා දෙන ලදී. ඒ අනුව නගරය හා නාගරික ජීවිතය ස්වාභාවික පරිසරයේ තරඟකාරීත්වයේ ප්‍රතිඵලයක්, එනම් නාගරික ලක්ෂණ නිශ්චිය කිරීමේදී ස්වාභාවික පරිසරය යන්න බලපෑම් සහගත බලවේගයක් බව පාර්ක් දක්වීය. මොහු විසින් මානව පාරිසරවේදය දියුණු කරන ලදී (ස්ලැට්ටෙරි 1985: 22).

තවදුරටත් මොහු දක්වන පරිදි නගරයක් යනු මානසික වශයෙන් රාජ්‍යයක් හා ශාරීරික වශයෙන් සිරිත් විරිත් සම්ප්‍රදයන්ගෙන් සමන්විත වූවකි. එම සම්ප්‍රදය තුළ නිත්‍යව පවතින සංවිධානාත්මක ආකල්ප හා මනෝභාවයන්ගෙන් යුක්තය. වෙනත් අර්ථයකින් දක්වන්නේ නම් නගරයක් යනු  හුදෙක් භෞතික යාන්ත්‍රණයක් සහ කෘතිම ගොඩනැගීමක් නොවේ. එය එහි සමන්විත පුද්ගලයනාගේ ප්‍රධාන ක්‍රියවලීන් හා සම්බන්ධය. එය ස්වභාවධර්මයේ නිෂ්පාදනයක්. එනම් විශේෂයෙන්ම මානව ස්වාභාවයේ නිෂ්පාදනයක් වේ. එනම් පාරිසරික සාධක මුල්කරගෙන ඇතිවන සමාජ පර්යාය, ආර්ථික පර්යායක් හරහා ක්‍රියාත්මක වන සහ එය දේශපාලනික සහ සදචාරාත්මක පර්යායකින් ද යුතු බව පෙන්වා දී ඇත (ලේකම්ආරච්චි 2009: 94).

හැරිස් සහ උල්මාන් 1945 දක්වන පරිදි මොහුගෙ න්‍යායට එල්ල වූ ප්‍රධානතම විවේචනයක් වූයේ නාගරික පරිසර විද්‍යාව කෙරෙහි පමණක් අවධානය යොමු කර ඇති බවයි. තවද ඔවුන් දක්වන්නේ මෙමගින් පමණට වඩා සරල සහ සමාන්‍යකරණය කරන ලද එළඹුමක් බවට ද පසු කාලීනව විවේචන එල්ල වූ බවයි (හැරිස් සහ උල්මාන් 1945, උපුටා ගත්තේ ලේකම්ආරච්චි 2009: 94).

**අර්නස්ට් බර්ජර්ස්**

බර්ජර්ස් විසින් නගරයේ මිනිසුන්ගේ පදිංචිය හා භූමිය පරිහරණය කිරීමේ රටාව පිළිබඳව ඉදිරිපත්කර ඇති අදහස් නගරය පිළිබඳව වටහා ගැනීමේදී වැදගත් වේ. මොහු විසින් 1925 දී "The Growth of the city" කෘතිය හරහා නගර පිළිබඳව සංකේන්ද්‍රීය කලාප න්‍යාය ඉදිරිපත් කරන ලදී. එම න්‍යායට අනුව නගරයේ අභ්‍යන්තර ව්‍යුහය කොටස පහකට බෙදූ රවුම් පහක් අනුව ඉදිරිපත් කර ඇත. එනම්; 01. මධ්‍ය ව්‍යාපාරික දිස්ත්‍රික්කය 02. ක්‍රාන්ති කලාපය. 03. නිදහස් සේවයකයින්ගේ කලාපය. 04. ඉහළ නේවාසිකයන්ගේ කලාපය. 05. සංචලතාවයට ලක්වන ජනතාව ජීවත්වන කලාපය. (බර්ජස්, උපුටා ගත්තේ හෝර්ටොන් සහ හන්ට් 1980: 432). මෙහිදී එක් න්‍යෂ්ටියක් මුල්කරගෙන නගරය ව්‍යාප්ත වන බව මොහු දක්වයි. එය විලකට ගලක් ගැසූ විට නැගෙන රැලි වාගේ මෙන් නගරය සැදෙන බව මොහු දක්වයි. මෙම ආකෘතියට අනුව කඩසාප්පු, රජයේ කාර්යාල, ව්‍යාපාරික ස්ථාන, සිනමාශාලා, හෝටල් ආදිය මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රිකයේ ඇති අතර, ක්‍රාන්ති කලාපයේ මුඩුක්කු හා පැල්පත්, කර්මාන්තශාල ආදිය ඇති අතර, නිදහස් සේවකයන්ගේ කලාපය තුළ පාසල්, නිවාස ආදියත්, ඉහළ නේවාසිකයන්ගේ කලාපය තුළ ඉහළ පාන්තික නිවාස හා අවසන් කලාපය තුළ සංචලතාවයට ලක්වන ජනතාව සිටි.

මෙම න්‍යාය මගින් නගරය පිළිබඳව හඳුනා ගැනීමක් සිදු වුවද මෙම න්‍යායට බොහෝ විවේචන එල්ල වී තිබේ. එනම් ෆීරි දක්වන්නේ පොහොසතුන් සැමවිටම උපනාගරික ප්‍රදේශවලට නොයන බවයි (උපුටා ගත්තේ ස්ලැට්ටෙරි 1985: 24). එසේම මෙම ආකෘතියට නගරය නිර්මාණයවීමේදී ඇතැම් කණ්ඩායම්වල බලය හඳුනාගැනීමට නොහැකි වී ඇති අතර, නගරය හැඩ ගැසීම මිනිසුන්ගේ පාලනය ඉක්මවා ගිය ස්වාභාවික දෙයක් ලෙස දකින බැවින් එයින් නගරයෙන් පිටතින් වන සමාජ සාධකවල බලපෑම අතපසු වී ඇත (ස්ලැට්ටෙරි 1985: 24). එසේම මෙම න්‍යායට එල්ලවන තවත් විවේචනයක් වන්නේ මෙම න්‍යාය පූර්ව කාර්මික නගරවලට අදාළ නොවන බවයි. එනම් පූර්ව කාර්මික නගරවල ප්‍රභූන් නගර මධ්‍යයේ සිටි අතර, දුප්පතුන් නගරයේ වෙනත් කලාපවල සිට ඇත (හොර්ටොන් සහ හන්ට් 1980: 432). එසේම හොයිට් 1933 කේන්ද්‍රික මානය පිළිබඳ න්‍යායෙන් දක්වන්නේ නගරය සංවර්ධනය වන්නේ ඒක කේන්ද්‍රික චක්‍රයක් වටා නොව කේන්ද්‍රික ඛණ්ඩයක් වටා බවත්, එක් එක් වෘතවල කාර්යභාරය බර්ජස් විසින් බෙද තිබෙන ආකාරයට වඩා එහි කාර්යභාරය සංකීර්ණත්වයකින් යුත්ත බවයි (හොයිත්, උපුටා ගත්තේ හොර්ටොන් සහ හන්ට්ගෙනි 1980: 433). එසේම හැරිස් හා උල්මාන්ගේ 'බහුවිධ න්‍යෂ්ටික න්‍යායෙන්' දක්වන්නේ නගරයක් තුළ ප්‍රධාන න්‍යෂ්ටියට අමතරව (කේන්ද්‍රිය කලාපයට අමතරව) කුඩා ප්‍රමාණයේ න්‍යෂ්ටීන් ගණනාවකින් සැදුම්ලත් අවකාශයක උපනාගරික කලාපය තෙක් ව්‍යාප්ත වන බවයි (හැරිස් හා උල්මාන්, උපුටා ගත්තේ හෙස්, මාර්ක්සන් සහ ස්ටෙයින්ගෙනි 1982: 511). ගිඩ්අන් දක්වන්නේ මෙම ආකෘතිය විශ්වීය එකක් නොවන බවයි. එසේම මෙය සංවර්ධිත රටක ආදර්ශයක් වූ හෙයින් සංවර්ධනය වෙමින් පවතින රටවලට නොගැලපෙ. තවද චිකාගෝ නගරයේ කළු ජාතීන් ජීවත් වූ Black Belt නම් කලාපය පදනමකින් තොරව මේ ආදර්ශයේදී දෙකඩ කළේ යැයි විවේචනය වූ අතර, ජාතීන්ගේ එකරාශීවීම ආදි කරුණු මෙහිදී සැලකිල්ලට ගෙන නොතිබීම දැඩි ලෙස ගිඩ්අන්ගේ විවේචනයට ලක්විය (ගිඩ්අන්, උපුටා ගත්තේ මානවඩු සහ ලියනගේ 2008: 129). තවද මෙම න්‍යාය මගින් තිරස් පැතිරීම ගැන පමණක් බලා ඇති අතර, සිරස් පැතිරීමේ ඇති කාර්යයම විවිධත්වය ආදිය නොසැලකා හැර ඇත (මානවඩු සහ ලියනගේ 2008: 129). එසේම මෙම න්‍යාය කොළඹ නගරයට ආදේශ කර බලනවිට ද දැකිය හැක්කේ එම න්‍යායට විවේචනයක් ලෙස එය ගෙන ආ හැකිය. එනම් බර්ජස් විසින් මෙම ආකෘතිය යටතේ වෘත්තාකර වලලු හරහා නගරය දක්වා ඇති අතර, කොළඹ නගරයේ එක් පැත්තක් මුහුදින් වට වී ඇත. එබැවින් කොළඹ නගරය ඇසුරෙන් වෘත්තාකාර ආකාරයට නාගරික ව්‍යුහයක් දැකිය නොහැකිය.

**ලූවී වර්ත්**

වර්ත් බොහෝ දුරට නාගරිකත්වය, නාගරික ජීවන රටාව පිළිබඳ අවධානය යොමු කර ඇත. ඔහුගේ 1938 'American Journal of Sociology' සඟරාව සඳහා සැපයූ "Urbanism as a way of life" යන ලිපිය මගින් නගරය නිර්වචනය කොට ඇත්තේ විශාල, ස්ථිර වාසස්ථාන සහිත ඝනත්වයකින් යුතු සමාජ සංස්කෘතික වශයෙන් විෂම ජාතීය පුද්ගලයන්ගෙන් සමන්විත ස්ථානයක් ලෙසය. ඒ අනුව මෙහදී ඔහු නගරයක් අවබෝධ කර ගැනීම සඳහා මූලික සංකල්ප 03 ක් ඉදිරිපත් කරයි. එනම්; 01. ජන සංඛ්‍යාව 02. ජන ඝනත්වය 03. විෂමජාතීත්වය වේ (ස්ලැට්ටෙරි 1985: 24). විවිධ කණ්ඩායම් නගරයට සංක්‍රමණයවීමත් සමඟම නගරය තුළ විශාල විවිධත්වයක් ඇති වේ, සමාජ සම්බන්ධතා සංකීර්ණ වේ. මේ නිසා විධිමත් පාලනයක අවශ්‍යතාවය ඇති වේ. අනෙක් අතට විවිධ පෞරුෂයන් සහිත පුද්ගලයන් සමඟ අන්තර් සබඳතා හරහා පන්ති ව්‍යූහය සංකීර්ණතාවයට පත්වන අතර, සමාජ චලතාවය ඉහළ යයි. එමෙන්ම ඔහු දක්වන්නේ නගරය ඉතා කටුක, අපරාධ වැඩි, ජරාජීර්ණ වූ ස්ථානයක් ලෙසත්, නගරයේ ජීවත් වන මිනිසුන් හුදෙකලා වී ඇති බවත්ය. එනම් නගරයේ මේ ජනගහනය, ඝනත්වය හා විවිධත්වය මගින් සමාජ විසංවිධානය, අපෞද්ගලීකරණය හා භූගෝලීය, සමාජ චලතාවය ඇති වේ. එමෙන්ම පුද්ගලයා අන් අය සමඟ (රැකියා ස්ථානයේ, කඩසාප්පු වලදී, පාරේදී) ඇති සබඳතා තාර්කික, නොගැඹුරු හා අස්ථාවර වේ. එමෙන්ම නගරය පුද්ගලයන් ආරක්ෂාව ලබාගැනීමට සහ තමන් යම් ප්‍රජාවකට අයත් යන්න පිළිබඳ හැඟීමක් ඇති කරගැනීම සඳහා විවිධ සමිති සමාගම්වලට සම්බන්ධවීම හෝ සම අදහස් දරන ප්‍රදේශවලට මාරුවීම සිදු වේ (ස්ලැට්ටෙරි 1985: 24).

කෙසේවෙතත් වර්ත්ගේ මෙම අදහස් වලට නොයෙක් විවේචන ද එල්ල වී ඇත. එනම් විවේචකයන් දක්වන්නේ වර්ත් විසින් ඔහුගේ පර්යේෂණාගාරය ලෙස චිකාගෝ නගරය යොදගත් බැවින් හර්බට් ගැන්ස් (1968) තර්ක කරන්නේ 1920 දී දක්නට ලැබුණු චිකාගෝ නගරය ආදර්ශයක් ලෙස ගත නොහැකි බවයි. එයට හේතුව වන්නේ එම නගරයට සංක්‍රමණිකයන්ගේ අසාමාන්‍ය ආගමනයක් සිදුවීමත්, ඒ නිසා සමාජ පර්යාය බිඳීයාමත් සිදු වී තිබීමයි. එසේම ජනසංඛ්‍යාව හා ඝනත්වය මානසික පීඩනයක් ඇති කරයි යන වර්ත්ගේ අදහස ජනගහන වර්ධනය වේගවත් කරන නමුත් මරණ අනුපාතය, රෝග සහ සමාජ විසංවිධානය අවමව පවතින හොංකොං වැනි නගර මගින් අභියෝගයට ලක්කරන බවයි. තවද වර්ත් දක්වන ලෙස මිනිසුන්ගේ චර්යාවට බලපාන ප්‍රධාන කරුණ වන්නේ නාගරික සංස්කෘතිය වුවද, ඔහුට ඇති ප්‍රධානම විවේචනය වන්නේ ගැන්ස්, විලියම්ස්, කාස්ටෙල්ස් වැන්නවුන් දක්වන ලෙස නාගරික සංස්කෘතිය යන්න නාගරික ජීවිතයට හේතුව නොව එය නාගරික ජීවිතයේ ප්‍රතිඵලයක් බවයි. එනම් වර්ත් නාගරික ජීවිතය ලෙස සැලකූ දෙය ඇත්ත වශයෙන්ම කාර්මික හෝ ධනවාදී එකක් බවයි (ස්ලැට්ටෙරි 1985: 24). කෙසේවෙතත් 1960 ගණන් පමණ වන තුරුම ලුවී වර්ත්ගේ මෙම න්‍යායට විශාල පිළිගැනීමක් ලැබිණි.

**නගරය තේරුම් ගැනීම සඳහා වැදගත් වන නව වෙබර්වාදීන්ගේ න්‍යායාත්මක පර්යාවලෝක**

1960 ගණන් වලින් පසු නාගරික සමාජ විද්‍යාඥයින් විසින් පාරිසරික, මනෝවිද්‍යාත්මක සහ සංස්කෘතික කරුණු වලින් පරිබාහිර නාගරික ව්‍යුහය හා එහි කෘත්‍යයන් පදනම් කොට ගෙන නිර්වචනය කිරීම සිදු විය. විශේෂයෙන්ම නව වෙබේරියාන් සහ නවමාක්ස්වාදී න්‍යායධරයන්ගේ අදහස් මෙහිදී වැදගත් වේ. මෙහිදී නව වෙබර්වාදීන් නගරය පිළිබඳ දක්වන ලද අදහස් පොදුවේ සලකා බැලීමේදී මොවුන් නගරයක පංති සකස්ව ඇත්තේ නගර සැලසුම්කරුවන් හා නගරයේ පරිපාලකයින් විසින් සම්පත් බෙද හැර ඇති ආකාරය අනුව බව දක්වයි. එනම් නාගරික පරිපාලකයින් ගන්නා තීරණ මත නගරයේ සැකැස්ම ඇති වී ඇති බවයි. ඒ අනුව මොවුන් සීමිත සම්පත් බෙදහරින නීති සහිත ස්ථානයක්ය යන ප්‍රවේශයෙන් නගරය අවබෝධ කොට ගැනීමට උත්සහ දැරීය (හෝල් 2006: 24). නව වෙබර්වාදීන් අතර, ජෝන් රෙක්ස්, රොබට් මුවර් හා ආර්. ඊ. පාල් වැදගත් වන අතර, මොවුන්ගේ න්‍යායාත්මක අදහස් පිළිබඳව පහත දක්වනු ලැබේ.

**ජෝන් රෙක්ස් සහ රොබට් මුවර්**

නව වෙබර්වාදීන් ලෙස පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ මොවුන් 1967 දී "Race, Community and Conflict: A Study of Sparkbrook" කෘතිය මගින් සුළු ජනවාර්ගික කොටස් හා ඔවුනට බර්මින්හැම් නගර අභ්‍යන්තර නිවාස සඳහා වන ප්‍රවේශය පිළිබඳ අධ්‍යයනයකින් "නිවාස පන්ති" හතක් හඳුනාගන්නා ලදී. නගරය තේරුම් ගැනීම සඳහා මෙම නිවාස පන්ති ඉවහල්වන බව මොවුන්ගේ විශ්වාසය විය. ක්‍රාන්ති කලාපය පිළිබඳ බර්ජස්ගේ අදහස සහ වෙබර්ගේ සමාජ පන්තිය පිළිබඳ අදහස ඇසුරෙන් මොවුන් දක්වන්නේ නිවාස බෙදහරින්නේ වෙළෙඳපළ බලවේග මගින් නොව, විවිධ නිවාස පන්ති අතර "පන්ති අරගලය" තුළින් බවය. එසේවුවද සමාජ පන්ති සාමාන්‍යයෙන් වෘත්තිය මත පදනම් වුවද මොවුන්ගේ විශ්ලේෂණයේදී නිවාස පන්තිය පදනම් වන්නේ යම් කණ්ඩායමකට පුද්ගලික නිවාස ඉදිකරන්නන්ගේ හෝ රජයේ නීති රෙගුලාසි වලට අවනතවීමට ඇති හැකියාව මතය (ස්ලැට්ටෙරි 1985: 32).

මේ හා සමගම ජෝන් රෙක්ස් සහ ටොම්ලින්සන්ගේ 1979 "Colonial Immigrants in a British City" යන ග්‍රන්ථය තුළින් ද මොවුන් තර්ක කළේ පුද්ගලයන්ට නිවාස සඳහා ඇති ප්‍රවේශය තීරණය වන්නේ ඔවුන්ගේ රැකියාව මත පමණක් නොව ඒ සඳහා වර්ගිකත්වය ආදී බොහෝ කරුණු බලපාන බවයි. උදහරණ ලෙස නිවාස පහසුකම් ගත් විට සුදු ජාතික

කම්කරුවකුවීමෙන් ආසියාතික ගණකාධිකාරීවරයෙක් වනවාට වඩා හොඳ නිවස පහසුකම් ලබාගත හැකිවීම දැක්විය හැකිය (ස්මිත්, 1977 උපුටා ගත්තේ හෝල්ගෙනි 2006: 29).

මොවුනට ඇති විවේචන සලකා බැලීමේදී ආර්. හැඩ්ඩොන් දක්වන්නේ තමන්ට හිමි නිවාසය සමාජ ධූරාවලියේ තමන්ගේ තත්ත්වය සඳහා හේතුවක් නොව, එය තමන්ට හිමි තත්ත්වයේ ප්‍රතිඵලයක් බවයි. එනම් සමාජයේ අසමාන නිවාස ව්‍යාප්තිය, ධනය අසමාන ලෙස බෙදීයාමේ ප්‍රතිඵලයක් මිස අසාමාන නිවාස ව්‍යාප්තිය ධනය අසමානව බෙදීයාමට හේතුවක් නොවන බවය. එමෙන්ම පුද්ගලයාගේ වර්තමාන නිවාස තත්ත්වය අනාගතයේ ද ඔහුට පැවතිය හැකි නිවාස තත්ත්වයම නොවන බව තවත් විවේචනයකි. එනම් මින් දක්වන්නේ පුද්ගලයාගේ ආදායම වෙනස්වන විට නිවාස තත්ත්වය ද වෙනස්විය හැකි බවයි. මොවුන්ට ඇති තවත් විවේචනයක් වන්නේ පුද්ගලයන් දෙදෙනකුට නිවාස වෙළෙඳපළේ එකම තත්ත්වයක කිසිදක සිටිය නොහැකි බවයි. එමනිසා මොවුන්ගේ වර්ගීකරණය හරහා නිවාස පන්ති අනන්තයක් ඇති විය හැකි බව මේ විවේචනයන් දක්වයි. මීට අමතරව විවිධ අධ්‍යයන ගණනාවකින් පෙන්වා දී ඇත්තේ සෑම පන්තියකටම උපනාගරික ප්‍රදේශවල නිවාස ලබාගැනීමේ අභිලාශයක් නොමැති බවයි (ස්ලැට්ටෙරි 1985: 32).

**ආර්.ඊ. පාල්**

රොක්ස් සහ මුවර් ඔවුන්ගේ න්‍යාය හරහා නාගරික සම්පත් බෙදහැරීම වෙළෙඳපළ බලවේගවල පමණක් නොව පොදු හා පුද්ගලික අංශයේ විවිධ නාගරික කළමණාකරුවන්ගේ තීරණ හා ක්‍රියාවන්වල ප්‍රතිඵලයක් ලෙස දැක්විය. මෙම අදහස් අනුව යමින් පාල් 1975 දී "Whose City" කෘතිය හරහා "නාගරික කළමාණාකරණවාදය" (Urban Managerialism) පිළිබඳ අදහස ඉදිරිපත් කර ඇත. මෙම න්‍යායට අනුව නාගරික සම්පත් බෙදහැරීම පාලනය කරන්නේ ගොඩනැඟිලි ඉදිකිරීමේ ක්ෂේත්‍රයේ කළමණාකරුවන්, බැංකු නිලධාරීන්, සැලසුම්කරුවන් යනාදීන්ය. ඔහු දක්වන්නේ මෙවැනි සම්පත් බෙදහැරීමක් මගින් නව ආකාරයක පන්ති අරගලයක්, නව විරෝධතා කණ්ඩායම් වර්ග ඇති වන බවයි. මොහුද රෙක්ස් හා මුවර් මෙන් කළමණාකරණවාදය හරහා නාගරික විශ්ලේෂණයේදී බලය හා ගැටුම යන්න කේන්ද්‍ර කොට දක්වයි (ස්ලැට්ටෙරි 1985: 33).

කෙසේවෙතත් මොහුට එල්ල වී ඇති විවේචන සලකා බැලීමේදී මෙම න්‍යාය මගින් නාගරික බල ව්‍යූහයේ මධ්‍යම පාන්තිකයන් කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් එම ව්‍යූහයේ ඉහළින් සිටින ප්‍රතිපත්ති සකසන්නන් නොසලකා හැරීම සම්බන්ධයෙන් විවේචනයට ලක්ව ඇත. ඊට අමතරව මෙමගින් මෙවැනි සම්පත් සීමිත වන්නේ ඇයි? තීරණ ගැනීමේදී වඩා වැදගත් නාගරික කළමණාකරුවන් වන්නේ කවුරුන්ද? යනාදිය පිළිබඳ පැහැදිලි කිරීමක්

නොමැතිවීම තවත් විවේචනයකි. මෙම විවේචනයන්ට අනුව පාල්, ජැක් වින්ස්ලර් සමඟ එකතු වී දියුණු කාර්මික සමාජවල රජයේ භූමිකාව පිළිබඳව "corporation thesis" එකක් ඉදිරිපත් කළේය. නමුත් එය නාගරික ආර්ථිකයකට වඩා ජාතික ආර්ථිකයක් පිළිබඳ අධ්‍යයනයක් විය (ස්ලැට්ටෙරි 1985: 34).

**නගරය තේරුම් ගැනීම සඳහා වැදගත් වන නව මාක්ස්වාදීන්ගේ න්‍යායාත්මක පර්යාවලෝක**

නගරය පිළිබඳ නව වෙබර්වාදීන්ගේ අදහස් මෙසේ වන විට ඊට ප්‍රතිවිරුද්ධ අදහස් ඉදිරිපත් කරමින් නව මාක්ස්වාදීන් ද නගරය තේරුම් ගැනීම සඳහා අදහස් ඉදිරිපත් කර ඇත. නව මාක්ස්වාදීන්ගේ අදහස් ගත්විට මොවුන් දක්වන්නේ නගරයේ එදිනෙදා ජීවිතය තීරණය කිරීමට බලපා ඇත්තේ රජය ගන්නා තීරණ බවයි. ඒ අනුව රජය නගරයට එදිනෙදා ජීවිතයට අවශ්‍ය පහසුකම් ලබාදීම මගින් සේවකයින් හා කම්කරුවන් නගරයේ රඳවා ගන්නා අතර, එමගින් රජයට ධනය ඒකරාශීකරණය කර ගැනීමට බලාපොරොත්තු වන බව මොවුන් දක්වයි. මොවුන්ට අනුව නගරය සකස් කරන්නේ රජය විසිනි. රජයේ භූමිකාවේ වැදගත්කම ඉස්මතු කරමින් අදහස් දැක්වූ නව මාක්ස්වාදීන් අතර, මැනුවෙල් කාස්ටෙල්ස්, ඩෙවිඩ් හාර්වේ හා පීටර් සවුන්ඩර්ස් වැන්නවුන් වැදගත් වේ.

**මැනුවෙල් කාස්ටෙල්ස්**

මොහු මාක්ස්ව විවේචනය කළ ද එම සම්ප්‍රදාය තුළම ඉදිරියට යමින් වැදගත් අදහස් ඉදිරිපත් කළේය. මොහුගේ ප්‍රබල කෘති දෙකක් වන "The Urban Question: A Marxist Approach" (1977) සහ "The City and the Grassroot" (1983) කෘති මගින් ආර්ථික, සමාජ ව්‍යුහය හා අවකාශමය ව්‍යුහයන් අතර සබඳතාවය පිළිබඳව අවධානය යොමු කෙරීය. ඔහු නාගරික ගැටලු පාලනය කරන්නෙක් ලෙස රජයේ භූමිකාව පිළිබඳව වැඩි වශයෙන් කතා කර ඇත. ඒ අනුව ලුවිස් අල්තුසර්ගේ අදහස් වලින් දැඩි ලෙස බලපෑමට ලක් ව ඇති කාස්ටෙල්ස් දක්වන්නේ නව ආකාරයටක නාගරික විරෝධතාවන් ඇති වන බවයි. එය කම්කරුවන් හා ධනවතුන් අතර වන සම්ප්‍රදායික අරගල නොවන බව දක්වයි. මොහු දක්වන්නේ නූතන කර්මාන්තශාලා පිහිටුවා ඇත්තේ තවදුරටත් නගරය තුළ නොව නගරවලින් පිටත බවයි. එමෙන්ම නූතන ධනවාදය යනු ජාතික හා ජාත්‍යන්තර වශයෙන් බහුජාතික සමාගම් මගින් පාලනය කරන ලෝක පද්ධතියකි. එම නිසා වර්තමාන නාගරික ගැටුම් ඇති වන්නේ සාමූහික පරිභෝජනය සහ නාගරික සැලසුම් කිරීම මත වන බව මොහු දක්වයි. මෙහිදී මොහු සාමූහික පරිභෝජනය ලෙස දක්වන්නේ රජය විසින් ජනතාවයට ලබා දෙන සුභසාධනයට අවශ්‍ය පහසුකම්ය. ජනතාව මේවා සාමූහිකව පරිභෝජනය කරයි. ඔහු

දක්වන්නේ රජය ඉන් බලාපොරොත්තු වන්නේ ශ්‍රමය නිෂ්පාදනය කිරීමත් හා එමගින් රජයට නගරය පවත්වාගෙන යාම සඳහා ලාභ ලබා ගැනීමත් යන්න බවයි.

නාගරික සැලසුම් කිරීම ලෙස දක්වන්නේ නගරය ලාභ උපයන තැනක් බවට පත් කිරීමත්, ඒ සඳහා අවශ්‍ය වන අධෝව්‍යුහයක් රජය මගින් ඇති කොට ඇති බවත්ය. ඒ අනුව කාස්ටෙල්ස් ද ධනවාදී සමාජයක රජය පොදු උනන්දූන් උදෙසා කටයුතු කරන්නක් නොව පන්ති පාලනය කරන උපකරණයක් ලෙස දක්වයි (ස්ලැට්ටෙරි 1985: 35).

කෙසේවෙතත් කාස්ටෙල්ට එල්ල වන විවේචන සලකා බැලීමේදී ඔහු තම න්‍යාය සියලුම නගරවලට අදළ වන ලෙස විශ්වීයව ඉදිරිපත් කළ ද බොහෝ අධ්‍යයන පෙන්වා දෙන්නේ ඔහුගේ විශ්ලේෂණය සාමාන්‍ය ධනවාදී නගරවලට වඩා ප්‍රංශ නගරවලට අදළ වන බවය. එමෙන්ම පාල් දක්වන්නේ මෙම විශ්ලේෂණය තුළින් කාස්ටෙල්ස් ඉදිරිපත් කරන සාමුහික පරිභේජනය පිළිබඳ සංකල්පය අපැහැදිලි බවයි. එනම් මෙමගින් කාස්ටෙල්ස් අදහස් කරන්නේ සුබසාධන රජ්‍යයකින් සපයන භාණ්ඩ පිළිබඳව ද නැතහොත් සාමුහික පරිභෝජනය පමණක් ද යන්න පැහැදිලි නොවන බවයි. මක්නිසාද එවැනි සුබසාධන භාණ්ඩ සමාජවාදී නගරවලත් සපයන අතර, ධනවාදී නගරවල සුබසාධන භාණ්ඩ ඉන් වෙනස් වන්නේ කෙසේද යන්න ගැටලුවක් බවයි (ස්ලැට්ටෙරි 1985: 36). කාස්ටෙල්ටගේ විශ්ලේෂණයට සමානව නූතන ධනවාදයේ තීරණාත්මක සාධකයක් ලෙස නගර පිළිබඳ අදහස් ඉදිරිපත් කළ තවත් නව මාක්ස්වාදී න්‍යායදරයෙක් ලෙස ඩේවිස් හාර්වේද දැක්විය හැකිය.

**ඩේවිඩ් හාර්වේ**

මොහු 1973 "Socoial Justice and the City" කෘතිය මගින් 1960 සහ 1970 ගණන් අගභාගයේ ආර්ථික අර්බුදයේ මූලාශ්‍රයන් සෙවීමට උත්සහදැරූ අතර, ඉන් එම අර්බුදය නාගරික අවකාශය තුළ කේන්ද්‍රගතවීමට හේතු පැහැදිලි කරයි. එහිදී ඔහු නගරය ආයෝජනයට සුදුසු, පුළුල් අර්ථිකය තුළ රජයට සම්බන්ධ ලාභ ලබාදෙන, ගොඩනගන ලද පරිසරයක් ලෙස අවධානය යොමු කරයි (ස්ලැට්ටෙරි 1985: 38). මෙහිදී ඔහු ප්‍රාග්ධන සංචිතකරණය හා සංසරණය පිළිබඳ අවධනාය යොමු කෙරීය. ඒ අනුව නගර වඩා කාර්යක්ෂමව ප්‍රාග්ධන සංසරණය සඳහා ගොඩනගන ලද පරිසරයක් ලෙස දැක්වීය. මොහු නාගරික සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ලාභදායී භාණ්ඩ නිෂ්පාදනය, අධිනිෂ්පාදනය හා අධි සංසරණය දැකීය. එමෙන්ම පුද්ගලික නිවාස උපනාගරික ප්‍රදේශවල ඉදිවන අතර, අතිරික්ත ප්‍රාග්ධනය අධිසංසරණයට ප්‍රතිචාරයක් ලෙස වෙළඳපළවල් ඇති වන බව දැක්වීය. එනම් දේපළ වෙළඳපළ, නිවාස වෙළඳපළ හා ශ්‍රම වෙළඳපළ ආදිය නගර තුළ බිහිවන බවයි.

**සමාලෝචනය**

ඉහත දක්වන ලද ආකාරයට අනුව නගරය යන්න විවිධ න්‍යායධරයන්ගේ දෘෂ්ඨිකෝණයන්ගෙන් තේරුම්ගත හැකිය. පොදුවේ සලකා බැලීමේදී 1930 ගණන් පමණ වන තුරු ඉදිරිපත්ව ඇති න්‍යායාත්මක අදහස් තුළ නගරය යන්න පාරිසරික, සමාජ සංස්කෘතික හා මනෝවිද්‍යාත්මක කරුණු හරහා තේරුම් ගැනීමට දරූ උත්සහයක් බව පෙනේ. එමෙන්ම එහිදී විශේෂයෙන් වෙබර්, සිමෙල් වැන්නවුන්ගේ අදහස් කැපී පෙනන බව දක්විය හැකිය. අනෙක් අතට චිකාගෝ ගුරුකුලය යන්න නාගරික සමාජ විද්‍යා ක්ෂේත්‍රයට විශාල දයකත්වයක් දක්වා ඇති අතර, සංශෝධනයට ලක්වෙමින් හෝ චිකාගේ ගුරුකුලයේ අදහස්වල බලපෑම වර්තමනය තුළ ද දකගත හැක. වර්ත් වැන්නවුන්ගේ අදහස්වලට ලැබෙන පිළිගැනීම එහිලා විශේෂය.

කෙසේ නමුත් 1960 ගණන්වලින් පසු නාගරික සමාජ විද්‍යාවේ දිශානතිය වෙනස් කරමින් නාගරික ව්‍යුහය සහ එහි කෘත්‍යයන් මත වැඩි අවධානයක් යොමුකරමින් නගරය තේරුම් ගැනීමට උත්සහ දරීම දකිය හැකිය. එහිලා නව වෙබර්වාදීන්ගේ හා නව මාක්ස්වාදින්ගේ අදහස් දයක වී ඇත. එහිදී ඔවුන් ඇසට නොපෙනෙන සමාජ සබඳතා ආදිය පිළිබඳව වැඩි උනන්දුවක් දක්වා ඇති බව පැහැදිලිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


ද සිල්වා, අයි. 2004. ජනගහන අධ්‍යයනය: ශ්‍රී ලංකාව ඇසුරෙන්. කොළඹ: කතෘ ප්‍රකාශනයක්.

මානවඩු, එල්. සහ ලියනගේ, එන්. 2008. *නෙවන ලොව නාගරීකරණය.* පුංචි බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ලේකම්ආරච්චි, සී. 2009. 'නගරික අවකාශය අර්ථ විවරණය කිරීම: සාමාජීය විද්‍යා ප්‍රවේශ කිහිපයක් පිළිබඳව සමාලෝචනීය පාඨනයක්' පයීත, හත්වන වෙළුම. කොළඹ: සමාජ සංස්කෘතිය තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය.

Bhushana, B. 1994. *Anmol's Dictionary of Sociology.* New Delhi: Anmol publications PVT.

Giddens, A. 2001. *Sociology.* (4th edn), Oxford: Blackwell Ltd.

Hall, T. 2006. *Urban Geography.* (3rd edn), Great Britain: M.P.G. Books Ltd.

Hess, B.B., E.W. Markson & P.J. Stein. 1982. *Sociology*. New York: Macmillan Publishing Co.,INC.

Horton, P.B. & Hunt, C.L. 1980. *Sociology*. (5$^{th}$ edn). New York: McGraw-Hill Book Company.

Slattery, M. 1985. *Urban Sociology*. England: Causeway Press Ltd.